# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය-2015

## Primary Piriven Year End Term Test - 2015

5 වසර / Grade 5

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**සිංහල - I**
**SINHALA - I**

කාලය : පැය 03 යි.
Time : Two hours.

I කොටසේ හා II කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද , III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට 05 කට පිළිතුරු සපයන්න.

### I කොටස

01) i කෙටි පිළිතුරු සපයන්න.

(අ) සිංහල හෝඩියට ඇතුළත් ඝෝෂ මහාප්‍රාණාක්ෂර ලියා දක්වන්න.

(ආ) ඒවා හැඳින්වීමට උත්පත්ති ස්ථාන පදනම් කරගෙන යොදන නම් එක් එක් අක්ෂරය ඉදිරියේ ලියා දක්වන්න.

ii. වරහන තුළින් සුදුසු පදය තෝරා වාක්‍ය නැවත ලියන්න.

(අ) (අනුස්වාරය / විසර්ගය) ලෙස හැඳින්වෙන්නේ ස්වරයකින් පසුව යෙදෙන අනුනාසිකභාවය යි.

(ආ) (අනුස්වාරය / විසර්ගය) ලෙස හැඳින්වෙන්නේ ඌෂ්ම ශබ්දයකි.

iii. වරහන් තුළින් සුදුසු පදය තෝරා හිස්තැනට යොදා වාක්‍ය නැවත ලියන්න.

(අ) හල් ‘ත්’ කාරයට පසුව ‘ අ’ ස්වරය යෙදීමේ දී විශේෂ පිල්ලමක් භාවිත ................ (වේ / නොවේ)

(ආ) “රුපියල” යන පදයේ ‘ර’ යන්නට සම්බන්ධව ඇත්තේ ......... (පාපිල්ල/ඇදපිල්ල) යි.

iv. වරහන තුළින් සුදුසු පදය තෝරා හිස්තැනට යොදා වාක්‍ය නැවත ලියන්න.

(අ) ව්‍යඤ්ජනාක්ෂරයකට ‘ ඕ ’ ස්වරය එක් වී ඇති බව දැක්වීමට පිල්ලමක් ලෙස කොම්බුව ........................... (යොදා ගනියි / යොදා නොගනියි)

(ආ) ව්‍යඤ්ජනාක්ෂරයකට පසුව යෙදෙන ‘ර්’ සඳහා ............... (රේඵය / රකාරාංශය) යොදා ගනියි.

v. එක් එක් පේළියේ තිබෙන සදොස් පදය තෝරා ලියා දක්වා එහි නිදොස් පදය ඉදිරියෙන් ලියන්න.

(අ) ප්‍රාමාණික , ප්‍රාසාංගික , ප්‍රාගුණ්‍යය , ප්‍රාදූර්භූත.

(ආ) ප්‍රශ්වාස , ප්‍රස්තාරය , ප්‍රස්තාවනාව , ප්‍රස්ථාව පිරුළ.

vi. (අ) පහත දැක්වෙන වාක්‍ය කර්තෘ කාරකයට පෙරළා නැවත ලියන්න.

i. ගුරුවරුන් විසින් සිසුහු සැනසෙත්.
ii. සොරුන් විසින් ගම් වැනසේ.
iii. යහ ගුණදම් විසින් අපි සුරැකෙමු.
iv. මිතුරා විසින් තොපි සැනසෙහු.

(ආ) පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට පෙරළා නැවත ලියන්න.

i. ගොවියා කුඹුරු කොටයි.
ii. පඬුවෝ හරවත් පොත් ලියති.
iii. ඇමතිවරු රට වැසියන් රකිති.
iv. වඩුවෝ ගෙවල් තනති.

vii. (අ) පහත සඳහන් වාක්‍යවල පුරුෂ ලිංගික උක්ත පද වෙනුවට යෙදිය හැකි ස්ත්‍රී ලිංගික උක්ත පද යොදා වාක්‍ය නැවත ලියන්න.

i. නටන්නා ප්‍රේක්ෂකයන් පිනවයි.
ii. අශ්වයා විදුලි වේගයෙන් දුවයි.
iii. වලහා පැටවුන් සමඟ වනයට යයි.
iv. කොවුලා මිහිරි හඬින් නද දෙයි.

(ආ) නිවැරදි ක්‍රියා පද වරහන් තුළින් තෝරා වාක්‍ය නැවත ලියන්න.

i. කුරුල්ලා අහසේ පියාසර (කරයි / කරති).
ii. ගවයා ද රිය ද ගමට (යයි / යති).
iii. අපි නිදුක් (වෙත්වා / වෙමුවා).
iv. පියාණෝ දරුවන් (රකියි / රකිති).

viii. (අ) පහත දැක්වෙන වාක්‍යවල යෙදුණු සර්ව නාම පද උපුටා දක්වා ඒවා කිනම් ප්‍රභේදයකට අයත් සර්වනාම පද දැයි නම් කරන්න.

i. අපි ගුණගරුකයෝ වෙමු.
ii. අර පෙනෙන්නේ මහවැලි ගඟ යි.
iii. අයෙක් සුරාමතින් නටත්.
iv. සතුරන් රැඳී සිටින්නේ කොතැන ද ?

(ආ) පහත දැක්වෙන වාක්‍යවල යෙදුණු නිපාත නාම පද උපුටා දක්වා ඒ නිපාතවල අර්ථ දක්වන්න.

i. අක්කා මට මවක සේ සැලකුවා ය.
ii. ගුරුන් නිසා සිසුහු දිනති.
iii. ඔබ සැමට ජය අත් වේ ද?
iv. සාවා ද මුවා ද දිවි ගලවා ගත්හ.

ix. (අ) සුදුසු උපසර්ග පදයක් හිස්තැනට යොදා වාක්‍ය නැවත ලියන්න.

i. වෛද්‍යවරයා රෝගීන්ට .............කාර කළේය.
ii. රජය අනාථයන්ට ආධාර ................ දානය කරයි.
iii. වැඩිහිටියෝ තම දරුවන්ට ............. වාද කරති.
iv. දෙමාපියන් ............ කරණය කිරීමට දරුවෝ පෙළඹෙති.

(ආ) පහත සඳහන් වාක්‍යය සුදුසු විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

අහෝ අපට කුමක් වුණි ද යැයි නිමල් සුගත් සහ විමල් විමතියට පත් වූහ

x. (අ) පහත දැක්වෙන වාක්‍යවල " නා " යන පදය යෙදුණු තැන්වල අදාළ අදහස ඇති වෙනත් පදයක් යොදා වාක්‍ය නැවත ලියන්න.

i. දළදාව නා ලොවේ පුද ලැබීය.
ii. නා තුර වනස්පතියකි.
iii. ඇයට ඇත්තේ නා ලිය සදිසි ගමනකි.
iv. නා හිමියෝ සුමධුර හඬින් දහම් දෙසති.

(ආ) පහත දැක්වෙන වාක්‍ය නැවත ලියා ඒවා වැරදි නම් (x) ලකුණ ද නිවැරදි නම් (√) ලකුණ ද ඉදිරියෙහි යොදන්න.

i. පුතණුවන් යනු ගෞරවාර්ථ තද්ධිත නාම පදයකි.
ii. වහන්සේ යනු ගෞරවාර්ථ ප්‍රත්‍යයකි.
iii. ලෙස යනු උපසර්ග පදයකි.
iv. නැටවෙයි යනු කර්මකාරක ක්‍රියා පදයකි.

(ලකුණු 10 x 4 = 40)

## II - කොටස.

02) පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 200 – 250 පමණ වන සේ රචනයක් ලියන්න.

i. මෙලොව ඇති වටිනාම වස්තුව දරුවන් ය. එදා දරුවෙකු ලැබුණු විට මව්පියන්ට , සහෝදර සහෝදරියන්ට පමණක් නොවේ මුළු ගමටම එය සුබ ආරංචියකි.එබැවින් ඒ දරුවන් රැක ගැනීමට සැමදෙනා එකතු වූයේ මේ මගේ දරුවා ය යන උත්තුංග හැඟීමෙන් ය. නමුත් වර්තමානය වන විට තත්ත්වය උඩු යටිකුරු වී තිබේ. පියා අතින් දියණිය, සහෝදරයා අතින් සහෝදරිය, ඇතැම් ගුරුවරුන් විසින් සිසුන් අපයෝජනයට ලක්වන අවස්ථා සුලබ වීම මුළුමහත් රටේ ම අභාග්‍යයකි. නරුම කාමාතුරයන් විසින් දිනකට දරුවන් පස් දෙනෙකු පමණ අපයෝජනය වන බව සංඛ්‍යාලේඛන දත්ත පෙන්වා දෙයි.මෙයට බලපා ඇති කරුණු බොහෝ ය.මිනිසුන් තුළ සංවේදී හදවත් නොමැතිකම , පරිගණක තාක්ෂණයේ අවභාවිතය , ජනමාධ්‍යවල අදූරදර්ශී ක්‍රියාකලාපය, මත් ද්‍රව්‍ය භාවිතය, වැඩිහිටියන්ගේ අවධානය නොමැති වීම ආදිය ඉන් ප්‍රධාන වේ.මෙය වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග බොහෝ ය. නීතියෙන් පමණක් මෙය සිදු කළ හැකි දැයි ප්‍රශ්නයකි. සාර සංස්කෘතියට උරුමකම් කියූ අප මේ තත්ත්වයට පත් වූයේ ඇයි? මීට සාර්ථක ම විසඳුම වන්නේ සමස්ත සමාජයේ ම ආකල්පමය වෙනසක් සිදු කිරීමයි.මේ කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් "දරුවන් රැක ගනිමු මල් මෙන් නිරන්තරේ" යන මැයෙන් රචනයක් ලියන්න.

(ලකුණු 15)

ii. සිංහල පද්‍ය සාහිත්‍යයට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. අනුරාධපුර යුගයේ ඉතා දියුණු පද්‍ය සාහිත්‍යයක් පැවති බවට සියබස්ලකර දෙස් දෙයි. තවත් ජීවමාන සාධකයක් වූයේ සීගිරි කැටපත් පවුරයි. සිංහලයාගේ භාව ගීත එහි සංගෘහිත ය. පසුව සිංහල පද්‍ය කාව්‍ය බෞද්ධ මුහුණුවරක් ගත්තේ අලංකාරිකයන්ගේ බලපෑම නිසා විය හැකි ය. කෝට්ටේ යුගය සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන අතර සීතාවක යුගයෙන් පසු එය අවනතිය කරා ගමන් ගත් බවක් පෙනේ. වර්තමාන ගීත සාහිත්‍යය ද සිංහල පද්‍ය සාහිත්‍යයේ ම එක් ශාඛාවකි. නමුත් අද ඇසෙන දකින බොහෝ ගීත හුදු වචන මාලාවකට පමණක් සීමා වූ ඒවා මිස කලාත්මක අගයකින් විඳිය හැකි ඒවා නොවේ. මෙයට හේතුව පද්‍ය සාහිත්‍යය පිළිබඳ හැදෑරීමක් නොමැති කම ද? රසඥතාවෙන් හීන වීම ද? නිර්මාණශීලීත්වය ගිලිහී යාම ද යන්න සාකච්ඡා කළ යුතු ය. එසේ වූයේ ඇයි? ගීතයෙන් අපේක්ෂා කරන සුභාවිත රසාස්වාදය අද ලැබේ ද? මීට විද්‍යුත් මාධ්‍යයන් ද වගකිව යුතු ය. රසික සමාජය උසස් නිර්මාණ අපේක්ෂා කළ ද වාණිජ්‍යකරණය වූ කලාව, ඒවා අපෙන් ඈත් කරයි.අපට ආවේණික සුභාවිත ගීත සාහිත්‍යයක් ගොඩනගා ගැනීම රසඥයන්ගේ වගකීම වේ. මේ කරුණු කෙරෙහි අවධානය යොමු කරමින්“සුභාවිත ගීතයට මං තනමු”යන මැයෙන් රචනයක් ලියන්න.

(ලකුණු 15)

iii. එදා ගම ඉතා සුන්දර ය. නෙත සනසන නිල්වන් කෙත් යාය යි. ගත නිවාලන සිහිල් සුළංරැල් දසතින් හමා එන්නේ සීපද හඬ ද මුසුකර ගෙන ය. වැව් ඉහත්තාවේ ඇති වන අරණ පරිසරයට අලංකාරය එක් කරනවා පමණක් නොව අපමණ වූ සත්ත්ව ප්‍රජාවට වාස භූමි සපයයි. ගමෙහි කවුරුත් එකා මෙන් ඔවුනොවුන්ට උදව් කර ගනිති. ඒ සඳහා මග පෙන් වූයේ නිර්මල බුදු දහම යි. ගමෙහි ජීවයේ ප්‍රාණ වායුව වූයේ පන්සල යි. නමුත් වර්තමානයේ මේ තත්ත්වය වෙනස් ය. කාර්‍ය්‍ය බහුල බව නිසා යාන්ත්‍රිකරණය වූ මිනිසා සංවේදී බවෙන් තොර වී ඇත. එදා තිබූ සාර සංස්කෘතිය ඈත් වන්නේ එබැවිනි. නාගරීකරණය හා කාර්මීකරණය ගමේ සුන්දරත්වය ගිලගෙන ඇත. එදා සාමූහිකව සිදු වූ සියල්ල අද යන්ත්‍ර සූත්‍ර මගින් සිදු වේ. මිනිසා ද හුදකලා සත්ත්වයෙකු වී ඇත. සංවේදීකම අප තුළින් වියැකී යන්නේ අප ද නොදැනුවත්ව ම ය. අද අපට කළ හැක්කේ අතීතාවර්ජනය කරමින් එදා පැවති දේ සිහි කරමින් සුසුම් හෙළීම පමණි. එදා පැවති සුන්දරත්වය තරමක් හෝ රැකගත හැකි ද? මේ කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් “ගමක මහිම අප හැමටම දැනීයන්” යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(ලකුණු 15)

03) පහත දී තිබෙන පද්‍ය යුගලය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i.
ගවසා සුපුල් කඩුපුල් මල් නිල්වරල.
සලසා උකුළුවට රසුදුල මිණිමෙවුල.
සකසා දෙතන හර සඳනෙන් කර සිසිල.
දෙපසා ඉසින නිල් පැහැ නෙත් දිගු පුළුල.

ii.
මනහර නා මෙණෙවියනිඳ ළවැළි පිට.
ගෙනමිණි වෙණ තත් නියගින් මැද රුවට.
කන එව කියන බුදු ගුණ ගී මියුරු කොට.
සැනහෙව කැලණි ගඟ බඩ මඳ කලක් සිට.

(අ) මෙයින් විස්තර වන්නේ කවුරුන් ගැන ද?
(ආ) නෙත් යන පදය විශේෂ කර දැක්වීමට කවියා යොදා ඇති විශේෂණ පද උපුටා දක්වන්න.
(ඉ) මොවුන් මියුරු කොට ගායනා කරන්නේ මොනවාද?
(ඊ) මෙණෙවියනිඳ , නියගින් , රසුදුල , සිසිල , යන පද විසන්ධි කොට ඒවා ඉදිරියෙන් සන්ධි නාමය දක්වන්න.
(උ) සුපුල් , ගඟ බඩ , නිල්වරල , මිණිමෙවුල යන පදවල අදහස් දක්වන්න.

(ලකුණු 15)

## III- කොටස.

04) පහත දැක්වෙන ජේදය වචන 50 කින් පමණ සාරාංශ කර ලියන්න.

අද අපට ප්‍රධාන වශයෙන් ම වුවමනා කර ඇත්තේ සාමය යි. මීට ඉහත වකවානුවල දී මෙවැනි ප්‍රශ්න විසඳන ලද්දේ යුද්ධ මාර්ගයෙනි.එය මුළු මානව සංහතිය ම විනාශ කර දැමීමේ මාර්ගයක් නො වීය.අද අපට යුද්ධ කිරීමෙන් වැඩක් නැත. කවර හෙයින් ද? යුද්ධයකින් සමස්ත මනුෂ්‍යා සංහතිය ම විනාශ වන හෙයිනි. මේ ජය ගත්තෝ, මේ පරාජයට පත් වූවෝ ය යනුවෙන් විශේෂයක් කරන්නට ඉඩ නැත. වෙන්නේ සියල්ලන්හට එක විට ම මැරෙන්නට ය. ඒ නිසා මේ වකවානුවේ දී අපට අත්‍යවශ්‍ය වනුයේ සාමය යි.සාමය යනු නැති දෙයක් නොව. යුද්ධය නැති තැන සාමය තිබේය කීම වැරදි ය. වචනාර්ථයෙන් මෙන් ම යථාර්ථයෙන් ද අප සාමය අත්කර ගත යුතු ය. එය අත් කර ගන්නේ කෙසේ ද? එය අත්කර ගත හැකි මාර්ගය කිමෙක් ද? ලෝක සාමය අත්කර ගත හැකි මාර්ගය එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි මොනවට පෙන්වා දී ඇත.ඒ අනුව කළ යුත්තේ අපේ අවුල් වියවුල් සාමයෙන් හා සාකච්ඡාවෙන් බේරුම් කර ගැනීම ය.

(ලකුණු 15)

05) ඔබ පිරිවෙන් සාහිත්‍ය සංගමය මගින් සංස්කරණය කළ ශාස්ත්‍රීය සංග්‍රහයක් පිළිබඳ ව පුවත්පතක පළකර වීම සඳහා සංක්ෂිප්ත හැඳින්වීමක් ලියන්න.මෙහි නම, අන්තර්ගතය, එය කර ඇත්තේ කුමන පරමාර්ථයකින් ද එහි ප්‍රමාණය හා එයින් පාඨකයාට සැලසෙන ප්‍රයෝජන යන කරුණු ඇතුළත් විය යුතු ය. වචන 100-150 ත් අතර සංඛ්‍යාවක් තිබීම ප්‍රමාණවත් ය.

(ලකුණු 15)

06) i. බල (බැලීමෙහි) ධාතුව අතීත කාල කර්තෘකාරකයෙහි සියලු පුරුෂවල ඒක වචන බහුවචන දෙකෙහි වරනගා වගු ගත කර දක්වන්න.

ii. “නටන” යන කෘදන්ත නාමය පුරුෂ ලිංගයෙහි සියලු විභක්තිවල ඒක වචන බහු වචන දෙකෙහි වරනගා වගු ගත කර දක්වන්න.

(ලකුණු 15)